## 2022 වර්ෂයේ අහිමි වූ කාලය සඳහා ප්‍රතිසාධන සැලැස්ම

## (Recovery Plan for Learning Loss – 2022)

(10 ශ්‍රේණියේ පළමු වාරයේ කාලච්ඡේද 13ක් ද දෙවන හා තෙවන වාරවල කාලච්ඡේද 18ක් ද බැගින් කාලච්ඡේද 49ක් සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පවත්වාගෙන යාමට මෙම සැලැස්ම සකස් කර ඇත.)

# නාට්‍ය හා රංග කලාව

## 10 ශ්‍රේණිය- තෙවන වාරය

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
www.nie.lk

| නිපුණතාවය | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | කාලච්ඡේද |
|---|---|---|---|---|---|
| **10 ශ්‍රේණිය තෙවන වාරයෙන් තෝරා ගත් ඉගෙනුම් පල සහ පාඩම්** | | | | | |
| 1 නාට්‍ය හා රංග කලාවට පාදක සිද්ධාන්ත පැහැදිළි කරයි. | 1.6 රංග භූමිය හඳුනා ගනියි. | 1.6 රංග භූමි හඳුනාගැනීම (සිද්ධාන්ත) | ■ රංග භූමිය හඳුනා ගනියි.<br>■ රංග භූමියක තිබිය යුතු මූලික ලක්ෂණ වටහා ගනිමින් ප්‍රකාශ කරයි. | ■ රංග භූමිය හඳුනා ගැනීම<br>■ රංග භූමිය හඳුන්වන විවිධ නම්<br>■ රංග භූමිවල විශේෂ ලක්ෂණ<br>■ අතීතයේ රංග භූමිය ලෙස භාවිත කළ ස්ථාන | 01 |
| | 1.7 රංග භූමි වර්ග හඳුනා ගනියි | 1.7 රංග භූමි වර්ග හඳුනා ගනිම (සිද්ධාන්ත) | ■ රංග භූමි වර්ග හඳුනා ගනියි. ■ රංග භූමියේ නූතන මනඃකල්පිත බෙදීම් පෙන්වා දෙයි. | ■ රංග භූමි වර්ග<br>■ රංග භූමිවල විශේෂ ලක්ෂණ<br>■ රංග භූමිවල විවිධ හැඩ විමසීම<br>■ නූතන රංග භූමියේ මනඃකල්පිත ව බෙදා ඇති කොටස් හා බෙදීමෙන් ලැබෙන වාසි. | 01 |
| 2. ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොට ගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි. | 2.7 උචිත කතාවක් ආශ්‍රයෙන් නාට්‍ය පෙළ රංගනයක් බවට පත් කරයි. | 2.7.1 නාට්‍ය පෙළක් ලියමු. (සිද්ධාන්ත හා ප්‍රායෝගික) | ■ ගුණාත්මක යෙදවුම්වල යොදා ගෙන ඇති චිත්‍ර / ලිපි / පුවත්පත් / ඡායාරූප ආදී අධ්‍යයනය කර නාට්‍යෝචිත අවස්ථා තෝරා ගනියි.<br>■ පරිකල්පන ශක්තිය මෙහෙයවා නාට්‍ය නිර්මාණයෙහි යෙදෙයි.<br>■ නාට්‍යෝචිත සංවාද ලියයි.<br>■ පෙළ රචනයේ දී යටි පෙළින් මතු විය යුතු ජීවන දෘෂ්ටිය ගැන සැළකිළිමත් වෙයි.<br>■ පෙළට රංග විධාන ඇතුලත් කිරීමට උනන්දු වෙයි. | ■ කණ්ඩායම් සඳහා දී ඇති ගුණාත්මක යෙදවුමට අනුව / නාට්‍යෝචිත සිද්ධීන් තෝරා ගැනීම<br>■ තෝරා ගන්නා ලද නාට්‍යෝචිත අවස්ථා සඳහා සංවාද ගොඩ නැගීම<br>■ නාට්‍යෝචිත අවස්ථා ගොඩ නැගීමට අදාළ චරිත තෝරා ගැනීම<br>■ රංග විධාන භාවිත කිරීම<br>■ නාට්‍ය සාමූහික ක්‍රියාවලියක් බව අවබෝධ කර ගනිමින් නාට්‍ය පෙළ රචනය | 02 |
| | | 2.7.2 නාට්‍යයක් රඟ දක්වමු. | ■ නාට්‍ය පෙළ අවබෝධයෙන් යුතු ව කියවයි.<br>■ නිෂ්පාදනයට සුදුසු නාට්‍ය පිටපතක් තෝරා ගනියි. | ■ නිෂ්පාදනය සඳහා සුදුසු නාට්‍ය පිටපතක් තෝරා ගැනීම. | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | ■ නාට්‍ය පෙළ භූමිකා සඳහා නළු නිළියන් තෝරා ගනියි.<br>■ ආනුෂංගික ශිල්ප අංගයන් භාවිත කරයි.<br>නාටය පිටපත් සාමූහික ක්‍රියාවලියකින් රංගයන් බවට පත් කරයි. | ■ නාට්‍ය පිටපතට සුදුසු භූමිකා සඳහා නළුවරණයකින් නළුනිළ සාමූහික රංගනයක් බවට අවබෝධ කර ගැනීම.<br>■ සමස්ත රංග කාර්ය සංවිධානය කිරීම | |
| 3. නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැලෙයි. | 3.5 නාට්‍ය නිෂ්පාදනය කරයි. | 3.5 නිර්දිෂ්ට නාට්‍යයට නව අර්ථකථනයක් | • නිර්දිෂ්ට නාට්‍ය පෙළෙහි දක්නට ලැබෙන දුබලතා හා ප්‍රබලතා හඳුනාගෙන පැහැදිළි කරයි.<br>• නව අර්ථකථනයක් සහිතව පෙළෙහි නිර්දිෂ්ට කොටසක් රචනා කරයි.<br>• නව අර්ථකථනයක් සහිතව ලියන ලද නාට්‍ය පෙළ නිෂ්පාදනය කරයි. | • කාල ගෝල නාට්‍යයේ පිටපත විමසුම.<br>• නිර්දිෂ්ට පෙළ ඇසුරින් නාට්‍ය පෙළ රචනය<br>• පෙළ රංගයක් බවට පත් කිරීම. | 05 |
| | 3.6 ප්‍රකාශනාත්මක නිරූපණයෙහි යෙදෙයි. | 3.6 ප්‍රකාශනාත්මක නිරූපණයෙහි යෙදෙමු. | • විවිධ සංගීත ඛණ්ඩ ඇසුරින් ප්‍රකාශනාත්මකව චලන ඉදිරිපත් කරයි.<br>• නිර්මාණාත්මක ප්‍රකාශන හැකියාවන් ප්‍රදර්ශනය කරයි. | • ප්‍රකාශනාත්මක චලන අරුත් ගැන්වීම.<br>• රිද්මය හා චලනයේ විශේෂතා අවබෝධ කර ගැනීම.<br>• ප්‍රකාශනාත්මක චලන ක්‍රියාකාරකම්. | 04 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 5.2 නාට්‍ය නිර්මාණය සමස්තයක් ලෙස අගය කරයි. | 5.2.2 කාලගෝල නාටකය අගය කරයි. | ■ නාට්‍යයක් නරඹා එය අගය කරයි.<br>■ අගය කිරීමට පාදක වූ හේතු ප්‍රකාශ කරයි.<br>■ නාඩගම් සම්ප්‍රදායයට අයත් රංගෝපක්‍රම අගය කරමින් කතා කරයි.<br>■ ජීවිතය සාර්ථක කර ගැනීමට අවශ්‍ය අත්දැකීම් ලබා ගැනීමටත්, ප්‍රතික්ෂේප කළ යුතු දෑ වටහා ගැනීමටත්, ''දික්තල කාලගෝල'' නාට්‍යය ඇසුරෙන් අත්දැකීම් ලබයි. | ■ චරිත ලක්ෂණ හඳුනා ගැනීම<br>■ නාටකීය අවස්ථා පැහැදිළි කිරීම<br>■ නාටකීය ආකෘතිය විස්තර කිරීම<br>■ නාටකීය අන්තර්ගතය සාකච්ඡා කිරීම | 03 |